

## පුරෝගාමී වෙබ් සන්නිවේදකයා

# ආචාර්ය විකුම්ප්‍රිය පෙරේරා




**ඇමරිකා එක්සත් ජනපදය සිය වාසභූමිය කරගෙන දිවි ගෙවන ආචාර්ය විකුම්ප්‍රිය පෙරේරා සයිබර් ලෝකයේ පුරෝගාමී මෙහෙවරක් කළ නිහඬ විද්වතෙකි. අන්තර්ජාලය ශ්‍රී ලාංකිකයනට ආගන්තුක යුගයේ දී සිංහල ගීත ශ්‍රවණය කරන්නටත් බාගත කරන්නටත් පහසුකම් ලබා දුන් සිංහලජූක්බොක්ස් www.sinhalajukebox.org/ වෙබ් අඩවිය ඉදිරිපත්කරමින් ලොව පුරා විසිරුණ ශ්‍රී ලාංකිකයනට ඉමහත් සේවයක් කළේ ඔහු බව බොහෝ අය දන්නේ නැත. සන්නස ආරම්භයේ සිටම සන්නසේ හිතවතකු වූ විකුම්ප්‍රිය සිය සිංහලජූක්බොක්ස් වෙබ් අඩවිය හරහා සන්නස පසුගිය කළාප කියැවිය හැකි සේවයක් ස්වෙච්ඡාවෙන්ම ආරම්භ කළේය. ඒ http://sannasa.sinhalajukebox.org/ ඔස්සේ ය. දැන් ඒ සේවාවට අවුරුදු දොළහක් සපිරෙයි. සන්නස කරන අප පවා පසුගිය කළාපයක් පරිශීලනය කරන්න අවශ්‍ය වූ විට වඩා ගොඩවන්නේ විකුම්ප්‍රිය පවත්වාගෙන යන සන්නස සංරක්ෂණ සේවාවටයි.**

**ආචාර්ය විකුම්ප්‍රිය පෙරේරා පසුගිය දා පුද්ගලික සංචාරයක් සඳහා මෙල්බන් නගරයට පැමිණි අතර මේ සන්නස ඔහු හා කළ සාකච්ඡාවකි.**

**අන්තර්ජාලට අපට අලුත් අත්දැකීමක් වන යුගයක ඔබ සිංහල ගීත වෙනුවෙන් වෙන් වූ වෙබ් අඩවියක් ආරම්භ කරනවා. මෙවන් අදහසක් ඔබට ඇතිවුණේ කොහොමද?**

පාසල් කාලයේ පටන් මට ගීතය, කවිය හා නව කථාව වැනි සාහිත්‍යාංග ගැන විශාල ඇල්මක් තිබුණා. අසූව දශකයේ ඇමරිකා එක්සත් ජනපදයට අධ්‍යාපනික කටයුතු සඳහා සංක්‍රමණික වීමත් සමගම මෙවැනි දේ ලබා ගැනීමට තිබුණු අවස්ථා නැති වී ගියා. ඒත් එක්කම මා ලඟ තිබුණු ගීත හා මිතුරන් ගෙන් බෙදා හදාගෙත් ගීත නිසා විශාල ගීත එකතුවක් රැස්වුනා. මෙම ගීත මා වැනිම ලංකාවෙහි සංක්‍රමණය වූවන් සමග එකතුව රසවිඳීමට පුළුවන් නම් හොඳයැයි සිතුනා. අන්තර්ජාලය හරහා මෙය කළ හැකි බව මට පෙනී ගියා. ඒ අනුව් තමයි මම සිංහලජූක්බොක්ස් අඩවිය නිර්මාණය කරන්නෙ. එය තමා මේ සියළු දේටම මුල.

**මෙයට කලින් සිංහ ගීත අසන්නට හෝ බාගත කරගන්නට හෝ වෙන්වුණ වෙබ් අඩවි තිබුණේ නැති තරම්. පූර්වාදර්ශ නොමැති වූ යුගයක මේ කාර්යය කරද්දි ඔබට මතුවූ අභියෝග මොනවාද? ඒව ජයගත්තෙ කොහොමද?**

ඔව්. මා මේ වෙබ් අඩවිය ආරම්භ කරන දවස්වල අන්තර්ජාලය හරහා සිංහල ගීත ඇසීමට තිබුණු පහසුකම බොහොම ප්‍රාථමික අවස්ථාවේ තමයි තිබුනේ. තාක්ෂණික හා වෙනත් පහසුකම් පවා බොහොම රළු තත්වයක තමයි තිබුණේ. අද පවතින තත්වය හා තිබෙන පහසුකම්, ලංකාවේ අපට අන්තර්ජාලයට පිවිසීමට තිබුනු හැකියාව ආදිය එදා තත්වය සමඟ සසඳන විට අහසට පොළොව වගේ You Tube එක එහෙම ආරම්භකරලවත් තිබුනේ නැහැ. මගේ මෙම කාර්යයට හවුල්වූ ජානක විමලධර්මවත් සමඟ එදා අපි තිබුනු තත්වයට අපට හැකි විසඳුමක් සෙව්වා. අපි සොයගත් විසඳුම තමයී සබ-ය්ක්වමත්වඉදංගදරටග ඕස්ට්‍රේලියාවේ වෙසෙන නලින් ජයවර්ධන ප්‍රවීණ ගායකයාත් ඔහුගේ විශාල ගීත එකතුව අප සමග බෙදා ගත්තා. අදටත් අපි සැම ලංකාවෙන් පිටත විසීම තමා ලොකුම අභියෝගය. නවතම ගීත හා ඉපැරණි ගීතවලට අපට තිබෙන ලබාගැනීමේ අපහසුව තමා විශාලම බාධකය. රසිකයන්ගේ නොමසුරු බෙදාහදා ගැනීම තමයි අපට සිංහල ගීත සුරැකීම සඳහා තිබෙන එකම මඟ. අපි ටිකෙන් ටික මේ සංස්කෘතිය නැවත බිහිකර ගැනීමට උත්සාහ කරන්න ඕනේ.

**ඔබේ අධ්‍යාපනික පසුබිම ගැන යමක් දැනගන්න කැමතියි**

මම කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිත පිළිබඳ විශේෂ උපාධිය හදාරා 1986 දී උසස් අධ්‍යාපනය සඳහා ඇමරිකා එක්සත් ජනපදයට සංක්‍රමණය කළා. ඇමරිකාවේ පර්ඩියු :ඡමරාමැ* විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබාගෙන දැන් කෙන්ට් රාජ්‍ය විශ්ව විද්‍යාලයේ :ණැබඑ ඍඑැ ඔබසඩැරිසඑහ* පීඨයක ගණිතය පිළිබඳ ඇසෝ-සියේට් ‍ිදප්ස්එැ* මහාචාර්වරයකු ලෙස සේවය කරනවා.

**විදෙස් ගතවන්නට හිතුවෙ ඇයි?**

මම කලින් පැවසුවාක් මෙන් විදෙස්ගතවීම සම්පූර්ණයෙන්ම මගේ අධ්‍යාපනයට බැඳිලයි තිබුනේ. ගණිත උසස් උපාධියක් සඳහා ඒ කාලයේ රටෙන් පිටවීම අවශ්‍යතාවක්. උපාධිය ගැනීමට ගතවුනු කාලය තුල විදෙස් ජීවිතයට හුරුවීම හා දරුවන් ලද පවුලක් බවට පත්වීම ඒ විදෙස් ගතවීම ස්ථිර තත්වයක් බවට පත්කලා. ඒ කාලයේ ලංකාවේ තිබුණු යුධ වාතාවරනයත් මෙයට බලපෑමක් කළා.

**ලංකාවෙ ගෙවූ ජීවිතය සිහිපත් කළොත්**

මගේ ගම වත්තල. මම වත්තල ශාන්ත අන්තෝනි මහ විදුහලෙනුත් කොළඹ ආනන්ද විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලබා කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිත අංශයට ඇතුලත් වුණා. මගේ වෘත්තිය ගණිතය ඉගැන්වීම. අපි ලංකාවේ සිටි අසූව දශකයේ පවා වත්තල අවට ප්‍රදේශ ගම්බද උරුවක් තමයි ගත්තේ. අද වෙනවිට අපි ඉපදුනු පරිසරය නාගරීකරණයට බඳුන්වෙලා. මම ලංකාවේ ගතකල කාලය ඉතාමත්ම මිහිරි කාලයක්. අවුරුදු උත්සව, පෙරහැර, වෙනත් ආගමික උත්සව, පල්ලියේ මංගල්ල ආදියෙන් අප උපන් ප්‍රදේශය බොහොම ක්‍රියාකාරී තත්වයක තමයි තිබුණේ.

**විදෙස්ගත ජීවිතය ගැන ඔබ තෘප්තිමත්ද?**

අනිවාර්යයෙන්ම. ඔබ කලාශිල්පියෙකු වශයෙන් ලංකාව තුල සිදුවන දේවල් ඒවට කෙලින්ම සහභාගි නොවී නිරීක්ෂකයෙකු වශයෙන් ඈත සිට බලා සිටීමට හැකිවීම හොඳ දෙයක්. විවිධ දේශපාලනික, ආගමික හා සංස්කෘතිකාංග ගැන හා ඒවායේ විවිධ ප්‍රතිඵල ඒ තුළ ජීවත් වෙන අයට පෙනෙනවා සාමාන්‍යයෙන් අඩුයි. පෙනුනත් ඒ ගැන ක්‍රියාත්මක වෙන්ට බැරි හේතු තියෙන්ට පුළුවන්. ඇමරිකාව වැනි එදිනෙදා ජීවිතයට අවශ්‍ය සෑම සියළු දේ සඳහාම තමාගේ දේශපාලනික මති මතාන්තර හා සමාජ තුළ ධන තත්වය කෙලින්ම බලනොපාන රටක ජීවන්වෙන විට කලා නිර්මාණවලට අවශ්‍ය නිදහස් තත්වය ලැබීම මම වඩාත් අගය කරනවා. ප්‍රාග්ධනය හා වෙනත් අවශ්‍යතාවල ගිලී ජීවිතය අරගලයක් කරගෙන සිටීමට ඇති තත්වයක් කලාකරුවෙකුට මෙන්ම සාමාන්‍ය පුරවැසියෙකුට උවත් එතරම් හොඳ දෙයක් නොවේ.

**ගීත රචකයකු ලෙස ඔබේ ඉලක්කය මොකක්ද?**

ගීත රචකයෙකු වශයෙන් මගේ මූලික අරමුණ විවිධ ගුරුකුල, ප්‍රබුද්ධ අප්‍රබුද්ධ වාද, සුභාවික එසේ නැති යන වාද වලින් වෙනස්ව ගීතයට සම්ප්‍රාප්තවීමටයි. ගීතයක අරමුණ අනුව සුදුසු වාදන, ස්වර රටා ආදිය යොදා ගැනීමත් හැම ගීත ආරකම සුභාවිත ගීත ඇතිබව වටහා ගැනීමත් මගේ මූලිකම අරමුණක්. ලංකාවෙන් පිටත ජීවත්වීම මට මෙයට ඇතුල්වීමට අවශ්‍ය නැවුම් ඇස් දෙකක්හා මනසක් ලබා දී තිබෙනවා. මම විවිධ ආරේ ගීත ලියා තිබෙනවා, තව දුරටත් ලියන්න බලාපොරොත්තු වෙනවා.

ලංකාවේ දැනට පවතින සමාජ පිලිගැනීම් පිලිබඳව විවෘතව බලන්නට ආරාධනාවක් කරන්නත් මම මගේ ගීත යොදා ගන්නට කැමතියි. ගිනතඳයෙකු වශයෙන් හැම ප්‍රශ්නයටම පිලිතුරු රාශියක් ඇතිබව හා නිවැරදි පිලිතුරු එකකට වඩා ඇති බව මම පිලිගන්නවා.

**මේ වන විට ඔබ කොපමණ ගීත ලියා තිබෙනවාද?**

මා ලියූ ගීත 200ක් පමන දැන් පටිගත වෙලා තියෙනවා. කලින් කිව්වා වගේ මෙම ගීත විවිධ ආරවලට ලියා තියෙනවා. මගේ ගීත වැඩිපුර ලංකාවේ වාදනය වෙන්නේ නැහැ. නමුත් මගේ අරමුණ ප්‍රචාරයම නොවන නිසා මෙම තත්වය ගැන මම එතරම් සැලකිල්ලක් ගන්නේ නැහැ. ප්‍රතිපූර්ණ ගායක නලින් ජයවර්ධන - එයා ඉන්නේ ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර - තමයි මගේ ගීත වැඩිපුරම ගායනය කර තිබෙන්නේ. ඔහු සමඟ මම සංගත තැටි තුනක්ම (3) කරලා තියෙනවා. 2008 වසරේ සිට සෑම වසරක්ම එම සංගත තැටිය බැගින් එළි දක්වලා තියෙනවා. දැන් තැටි 8ක් වෙළඳපොලේ තිබෙනවා. මේ ගීත අන්තර්ජාලය හරහා නොමිලේම අහන්න පුළුවන්. විවිධ වෙබ් අඩවිවල මේවා තියෙනවා. මීට අමතරව මම ගීත එක දෙක ලියාපු ඒවත් තියෙනවා සංගත තැටිවලට තවම අඩංගු කර නැති.

**අද දවසේ ගීත රචනා ක්ෂෙත්‍රය යම් අර්බුදයක තිබෙනවා. ඉස්සර ගායක ගායිකාවන් ගීත ලියවාගන්නට ගීත රචකයන් සොයා ආවා. අද වන විට ගීත රචකයන්ට සිදුවෙලා තිබෙනවා ගායක ගායිකාවන් සොයා ගොස් ඔවුන්ට මුදල් ගෙවා ගීත පටිගත කරවාගන්නට. මේ අර්බුදය ගැන ඔබේ අදහස දැනගන්නට කැමතියි.**

ඔබ කියන තත්වය ලංකාවේ පවතින බව ඇත්ත. හැබැයි මම එය අර්බුධයක් හැටියට සලක්නේ නැහැ. ඇත්ත වශයෙන්ම අර්බුදය තිබුනේ මුලිනුයි. ගීතය ශිල්පීන් 4 දෙනෙකුගේ සාමූහික කලාත්මක නිර්මාණයක්. ගායකයා, ගීත රචකයා, තනු නිර්මාපකයා හා සංගීත අධ්‍යක්‍ෂකයා යන අයගේ කලාත්මක හැකියවන් ඔප නැංවීමයි මෙතැනදි සිදුවන්නේ. මීට අමතර ගීත නිශ්පාදකයා පස්වැන්නක් ලෙස හවුල් වෙනවා. ගීතයක පැවැත්මට, ගීත ක්‍ෂේත්‍රය පැවැත්ම මේ සෑම එක් අයෙකුම මූලික වී නිර්මාණ කරන්නට ඕනේ. ගායකයා පමණක් මෙය කිරීමට මුල්වීම මෙන්ම අනෙක් හතරදෙනාත් මූලික වීම සිදුවිය යුතුයි. ලංකාවේ තවමත් තනු නිර්මාණකයා මූලික වීමෙන් හෝ සංගීත අධ්‍යක්‍ෂකයා මූලික වී මෙහි කෙරෙන නිර්මාන හරිම අඩුයි. මෙයත් සිදුවිය යුතුය. එවිට ගීත ක්‍ෂේත්‍රයේ වර්ධනයක් සිදුවනු ඇති.

මම දකින විදියට අද තිබෙන අර්බුදයනම් ගීතයක එක් එක් හවුල්කාරයාගේ (ඉහත කී පස්දෙනාගේ) සහභාගීත්වය හරිහැටි තක්සේරු නොකිරීමයි. නිවැරදිව මිල නොකිරීමයි. නිශ්පාදනයට මිල නියම

35 වන පිටට